මේ දෙක මගේ උම්මාවේ පිරිමින්ට තහනම්ය. ඔවුන්ගේ ගැහැණුන්ට අනුමතය

අලී ඉබ්නු අබී තාලිබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී:
අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තම දකුණතින් රත්රන් ද තම වම්
අතින් සේද ද රැගෙන සිටිනු මම දුටුවෙමි. පසු ව ඒ දෙක අතැති ව එතුමාණන් තම දෑත් ඔසවා මෙසේ පැවසීය: "මේ දෙක මගේ උම්මාවේ පිරිමින්ට තහනම්ය. ඔවුන්ගේ ගැහැණුන්ට
අනුමතය."
[පූර්ව සාධක සහිත හදීසයකි]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම දකුණතින් රත්රන් ආභරණ හෝ එවැනි යම් දෙයක් ද තම වම් අතින් සේද රෙද්දක් හෝ ඉන් කැබැල්ලක් ද රැගෙන මෙසේ පැවසූහ: "සැබැවින්ම සේද හා රත්රන් ඇඳීම පිරිමින්ට තහනම් වන අතර කාන්තාවන්ට ඒවා අනුමතය.

https://sunnah.global/hadeeth/si/show/4292